# පස්වන ඒකකය

10 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

I කොටස

## Information & Communication Technology

1. පහත ක්‍රියාවලි අතුරෙන් මෙහෙයුම් පද්ධතියෙහි (Operating System) මතක කළමණාකරණයට (Memory Management) අදාළ සෘජු ක්‍රියාවලිය කුමක් ද? (2016)
   1) කාර්යයක් නිම වීමෙන් පසු මතකය මුදා හැරීම.
   2) දෘඪ තැටියට ප්‍රවේශ වීම.
   3) ෆෝල්ඩරයක ගොනු සංවිධානය කිරීම.
   4) උපක්‍රම කළමණාකරණය

2. පහත සඳහන් වගන්ති සලකා බලන්න. (2017)
   A - දෘඪාංග කළමණාකරණය
   B - පරිශීලක අතුරු මුහුණත (user interface) ලබා දීම
   C - පැතුරුම්පත් හා වදන් සැකසුම් පහසුකම් ලබා දීම
   ඉහත සඳහන් ඒවායින් මෙහෙයුම් පද්ධතියක (Operating System) මූලික කාර්යය වන්නේ,
   1) A හා B පමණි.
   2) A හා C පමණි.
   3) B හා C පමණි.
   4) A, B හා C සියල්ල ම ය.

3. පරිගණකයට සම්බන්ධ කළ අලුත් මුද්‍රණ යන්ත්‍රයක් නිසි පරිදි ක්‍රියා කරවීම සඳහා විශේෂ මෘදුකාංගයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වේ. මෙම විශේෂ මෘදුකාංගය කුමක් ද? (2018)
   1) නිර්භාගීකාරකය (Defragment)
   2) උපක්‍රම ධාවකය (Device Driver)
   3) ගොනු කළමණාකරු (File Manager)
   4) කාර්යය කළමණාකරු (Task Manager)

4. පරිගණකයක් බලගැන්වූ පසු ප්‍රථමයෙන් ම ක්‍රියාකාරී වන්නේ පහත සඳහන් කවරක් ද? (2018)
   1) මූලික ආදාන ප්‍රතිදාන පද්ධතිය (BOIS)
   2) ඩිස්ක භාගීකරණ මෙවලම (Disk Partitioning Tool)
   3) මෙහෙයුම් පද්ධතිය (Operating System)
   4) කාර්යය කළමණාකරු (Task Manager)

5. පහත සඳහන් කුමන වරණයෙහි මෙහෙයුම් පද්ධතියක කාර්යයන් පමණක් අඩංගු වන්නේ ද? (2019)
   1) පඩිපත (Payroll) කළමනාකරණය, ක්‍රියාවලි කළමනාකරණය, ගොනු කළමනාකරණය
   2) ක්‍රියාවලි කළමනාකරණය, දත්ත සමුදා කළමනාකරණය, ගොනු කළමනාකරණය
   3) ක්‍රියාවලි කළමනාකරණය, මතක කළමනාකරණය, දත්ත සමුදා කළමනාකරණය
   4) ක්‍රියාවලි කළමනාකරණය, මතක කළමනාකරණය, ගොනු කළමනාකරණය

6. දැනට පවතින ගොනු (Files) මකා දැමීමකින් තොරව දෘඪ තැටියක භාවිතයට ගත හැකි ඉඩ අවකාශය වර්ධනය කර ගැනීමට පහත කුමන ක්‍රියා පිළිවෙතක් භාවිත කළ හැකි ද? (2019)
   1) දෘඪ තැටියේ පවතින ගොනු සම්පීඩනය (Compression) කිරීම
   2) දෘඪ තැටියේ සමහර ගොනු සැනෙලි ධාවකයට (Flash Drive) කොපි කර ගැනීම
   3) දෘඪ තැටිය හැඩසවි ගැන්වීම. (Formatting)
   4) දෘඪ තැටිය බෙදීම (Partitioning)

7. මෙහෙයුම් පද්ධතිවලට උදාහරණ පමණක් අඩංගු වන්නේ පහත කවරක ද? (2020)
   1) ඇන්ඩ්‍රොයිඩ්, උබුන්ටු, වින්ඩෝස් 10
   2) උබුන්ටු, වින්ඩෝස් 10, වින්ඩෝස් එක්ස්ප්ලෝරර් (Windows Explorer)
   3) ඇන්ඩ්‍රොයිඩ්, වින්ඩෝස් 10, වින්ඩෝස් එක්ස්ප්ලෝරර්
   4) ඇන්ඩ්‍රොයිඩ්, උබුන්ටු, වින්ඩෝස් එක්ස්ප්ලෝරර්

8. පහත සඳහන් වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද? (2020)

   A - විධාන ක්‍රියාත්මක කිරීම සඳහා මූසිකය භාවිත කිරීමේ පහසුකම චිත්‍රක පරිශීලක අතුරුමුහුණතක් (GUI) මගින් ලබා දේ.
   B – WIMP මගින් දක්වන්නේ Windows (කවුළු), Icons (නිරූපක), Menus (මෙනු) සහ Pointer (දර්ශක) යන්නයි.
   C - චිත්‍රක පරිශීලක අතුරුමුණත් හා සසදන විට, විධාන පේළි අතුරුමුහුණත (CLI) වඩා භාවිත මිතුරු (User-friendly) වේ.
   1) A පමණි
   2) B පමණි
   3) A හා B පමණි
   4) A, B හා C සියල්ලම

kalvisiru.com

9. පරිගණකයක දෘඪ ඩිස්කය හැඩසවි (Formatting) ගැන්වූ පසු ප්‍රථමයෙන්ම පරිගණකයට ස්ථාපනය කළ යුතු මෘදුකාංගය වන්නේ පහත සඳහන් දෑ අතුරෙන් කුමක් ද? (2021)
   1) Office පැකේජය
   2) මෙහෙයුම් පද්ධතිය
   3) ප්‍රතිවයිරස් මෘදුකාංගය
   4) වෙබ් අතරික්සුව

10. පහත සඳහන් කවර කාණ්ඩයක භාෂා පරිවර්තක (Language Translators) පමණක් අඩංගු වන්නේ ද? (2021)
   1) ඇසෙම්බලරය, සම්පාදකය (Compiler), අර්ථ වින්‍යාසකය (Interpreter)
   2) අර්ථ වින්‍යාසකය, සම්පාදකය, වෙබ් අතරික්සුව
   3) ඇසෙම්බලරය, මෙහෙයුම් පද්ධතිය, සම්පාදකය
   4) වෙබ් අතරික්සුව, මෙහෙයුම් පද්ධතිය, අර්ථ වින්‍යාසකය

lakshanrusiru.com